**සමීක්ෂණ**

# තරුණ පෙළේ ලිංගික දැනුම කෙබඳු ද?

**යොවුන් වියේ පසුවන්නන්ට තම ලිංගික දැනුම වර්ධනය කරගත හැකි ප්‍රධාන මාර්ගයක් වන්නේ තම මාපියන් සමග සාකච්ඡා කිරීමයි. එහෙත් තරුණ - තරුණියන්ගෙන් ඉතා වැඩි දෙනෙක් තම දෙමාපියන් සමග ලිංගික කරුණු සාකච්ඡා නොකරති.**

ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් ඉතා වැඩිදෙනෙකුගේ ලිංගික දැනුම දුර්වල ය. එයට ප්‍රධාන හේතුව ඔවුන් එම දැනුම ලබා ගන්නා අවිධිමත් පිළිවෙළ යි. මෙම තත්ත්වය ඔවුන්ගේ ජීවිත අඳුරු කරනවා පමණක් නොව රටේ අනාගත පරපුර ද රෝගීන් බවට පත් කරනු ලබයි.

කොළඹ සරසවියේ සමාජ විද්‍යා විශේෂ උපාධිය සඳහා නව යෞවනයන්ගේ ලිංගික චර්යාව මැයින් සපයන ලද නිබන්ධනය වෙනුවෙන් මා විසින් කරන ලද සමීක්ෂණය මගින් එම කරුණු හෙළිදරව් කර ගැනීමට හැකි විය. මෙම කරුණු මෙරට තරුණ පරපුරටත් ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ අධ්‍යයනවල යෙදෙන විද්වතුනටත් සුළු හෝ ප්‍රයෝජනයක් වෙතැයි සිතන බැවින් එම නිබන්ධයේ ඇතුළත් තොරතුරු මෙසේ ලිපියක් ලෙස ඉදිරිපත් කිරීමට මම කල්පනා කළෙමි.

මෙම නිබන්ධය සඳහා අවුරුදු 10 ත් 19 ත් අතර වයසේ වූ තරුණ තරුණියන් සහභාගී කරගත් නමුත් සමීක්ෂණයේ විෂයය තරුණ තරුණියන් විවෘත ලෙස සාකච්ඡා කිරීමට කැමති නොවූ එකක් බැවින් රටේ පෙදෙස් රැසක් පුරා විසිරුණු තරුණ තරුණියන් පිරිසක් මේ සඳහා යොදා ගැනීමට නොහැකි විය. එබැවින් සමීක්ෂණය සඳහා යොදා ගනු ලැබුවේ මා වසන නාවල පෙදෙසේ මා දන්නා හඳුනන තරුණ පිරිසකි. තරුණ තරුණියෝ තම ලිංගික දැනුම දියුණු කර ගැනීමට මාර්ග ගණනාවක් යොදා ගත්හ. ඔවුන්ගේ එක් ප්‍රධාන මාර්ගයක් වූයේ තම මිතුරන් සමඟ සාකච්ඡා කිරීම ය. ලිංගික කරුණු ගැන මිතුරන්ගෙන් දැනුවත් වී ඇත්තේ පිරිමි ළමයින් ය. මෙහිදී දැකිය හැකි අයහපත් ප්‍රවණතාවක් වන්නේ තම මිතුරාට ලිංගික කරුණු කියාදෙන 'ගුරුවරයාගේ' දැනුම ද අසම්පූර්ණ සහ අවිධිමත් එකක් වීමයි.

රූපවාහිනිය, ලිංගික අවබෝධය වර්ධනය කර ගැනීමට තරුණ කොටස් යොදා ගත් තවත් මාධ්‍යයකි. ලිංගික චර්යාවන් ගැන රූපවාහිනියෙන් දැනුවත්ව සිටියේ පිරිමි ළමයින් ය. ලිංගික චර්යාවන් ගැන දැන ගැනීමේදී රූපවාහිනිය තමන්ට බල නොපෑ බව ගැහැනු ළමයින් පොදුවේ පැවසුවත් නිශ්චිත කරුණක් ගැන ඔවුන්ගෙන් සෘජු ප්‍රශ්නයක් ඇසූවිට රූපවාහිනිය ද තම ලිංගික දැනුමට බලපා ඇති බව ඔවුන්ගෙන් ඇතැම් අය පිළිගත්හ.

ලිංගික කරුණු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට අසභ්‍ය චිත්‍රපටි ද තමන්ට උදව් වූ බව පිරිමි ළමෝ පැවසූහ. ලිංගික චර්යාවන් පිළිබඳ දැන ගැනීමේදී ගැහැනු ළමයින්ට අසභ්‍ය චිත්‍රපට කිසි ලෙසකින්වත් බලපා නොතිබුණි. කෙසේ වුවත් රූපවාහිනියට වඩා අසභ්‍ය චිත්‍රපටි තම ලිංගික දැනුම වර්ධනය කර ගැනීමට පිරිමි ළමයින් විසින් යොදගෙන තිබුණි.

යොවුන් වියේ පසුවන්නන්ට තම ලිංගික දැනුම වර්ධනය කරගත හැකි ප්‍රධාන මාර්ගයක් වන්නේ තම මාපියන් සමඟ සාකච්ඡා කිරීමයි. එහෙත් තරුණ තරුණියන්ගෙන් ඉතා වැඩි දෙනෙක් තම දෙමාපියන් සමග ලිංගික කරුණු සාකච්ඡා නොකරති. සමීක්ෂණයකට ලක් කළ ගැහැනු ළමයින්ගෙන් සියයට 20 ක් මාපියන් සමග කිසියම් අවස්ථාවක ලිංගික කරුණු ගැන සාකච්ඡා කර තිබුනත් පිරිමි ළමයින්ගෙන් සියයට 40 ක්ම තම මාපියන් සමඟ එවැනි කරුණු සාකච්ඡා කර නොතිබිණි. මෙයින් පෙනී යන්නේ ඔවුන් මාපියන් සමඟ සාකච්ඡා කළ ද එම සාකච්ඡා නිශ්චිත ක්‍රමානුකූල ආකාරයට ගොඩනැගී නොතිබූ බවයි. මේ සම්බන්ධයෙන් මෙම සමීක්ෂණයට හවුල් වූ 18 හැවිරිදි ක්‍රිස්ටි කීවේ, "මට මතක ඇති කාලෙක මම අම්මත් එක්ක ලිංගික කරුණු ගැන කතා කරලා නෑ" යනුවෙනි. "මම ගෑනු ළමයෙක් එක්ක කතා කර කර ඉන්නවා කව්දෝ දැකලා අම්මට කිව්ව දවසේ අම්මා කීවේ කෙල්ලන් අමාරුවේ දල විතරක් එන්න එපා කියලා. ඊට පස්සේ ඒක ගැන අම්මා මොකවත් ඇහුවෙ නෑ" යැයි 19 හැවිරිදි සුනිල් පැවසීය.

කෙසේ වෙතත් යුවතියන් තම අම්මලා සමග ලිංගික චරියා පිළිබඳ කතා බස් කෙරෙන බව අපට හෙළිවිය.

මේ අතර තරුණ තරුණියන්ගේ ලිංගික චර්යාවන් දැනුවත් කිරීමද අරමුණු කරගෙන පිහිටුවා ඇති පවුල් සැලසුම් ආයතනය, ඒඩ්ස් මර්ධන ව්‍යාපෘතිය වැනි ආයතන වලින් පවා තරුණ තරුණියන් ප්‍රමාණවත් ලෙස සිය ලිංගික දැනුම වර්ධනය කරගෙන නොතිබිණි. මෙම අධ්‍යයනයට හවුල් කරගනු ලැබූ පිරිසෙන් සියයට 42 ක්ම එවැනි ආයතන වලින් දැනුම ලබාගෙන නොසිටියහ. සියයට 33 ක් ම දැනුම ලබාගෙන තිබුණේ සුළු වශයෙනි. මේ අනුව පෙනී යන්නේ අධ්‍යයනය කළ පිරිස අතුරෙන් අති බහුතරය එනම් සියයට 91 ක්ම මාපියන්ගෙන් මෙන්ම විධිමත් ආයතන වලින් ද ලිංගික චර්යාවන් ගැන දැනුමක් ලබා නැති බව ය.

පිරිමි ළමයින් තම ලිංගික දැනුම තමා විසින් ම වර්ධනය කරගෙන තිබුන අතර ගැහැනු ළමයින්ගෙන් සියයට 90 ක් පමණම එම දැනුම තම පෙම්වතාගෙන් ලබාගෙන තිබුණ බව හෙළි විය.

තරුණ තරුණියන්ට ප්‍රමාණවත් ලිංගික දැනුම ලබාදීම කෙරෙහි මාපියන්ගෙන් සහ විධිමත් ආයතන වලින් ඉටුවී ඇති මෙහෙය සියයට 10ටත් අඩුබව මෙහිදී අනාවරණය විය.

මෙම සමීක්ෂණයෙන් හෙළිවූ වැදගත්ම කරුණ වන්නේ තරුණ තරුණියන් තම ලිංගික දැනුම ලබා ගැනීමේ මාර්ගවල ඇති අක්‍රමවත් බව ය. එය ඔවුනටත් සමාජයටත් අනාගතයේදී අර්බුදයකට මුහුණපෑමට සිදුවිය හැකි තත්ත්වයකි.

එම අර්බුදයෙන් ගොඩ ඒම පිණිස මම යෝජනා තුනක් ඉදිරිපත් කළෙමි.

එම යෝජනා මෙසේ ය:–

* හැම මාපියකුටම වැඩිවියට පත්වන තම දරුවන් සමඟ ලිංගික ජීවිතයට අදාළ කරුණු විවෘත ලෙස සාකච්ඡා කිරීම
* විධිමත් ආයතන මගින් තෝරා ගනුලබන තරුණ තරුණියන් ඇතුළු පිරිස්වලට ලිංගික චර්යාවන් පිළිබඳ නිවැරදි දැනුම ලබාදී ඔවුන් මගින් ඔවුන් වසන පෙදෙස්වල තරුණ තරුණියන්ට එම දැනුම බෙදදීමට පියවර ගැනීම
* මෙක්සිකෝවේ 1984 දී පැවති ජනගහන සමුළුවේදී සම්මත කරගනු ලැබූ 29 වැනි යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටීම

එම යෝජනාව මෙසේ ය :–

"සෑම ගැහැනු සහ පිරිමි ළමයකුට ම පවුල හා පරිසරය තුළින් සහ ලිංගික අධ්‍යාපන ආයතන තුළින් පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ දැනුම ලබා දෙන ලෙස සියලු රජයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ." ❑

**ප්‍රභාත් සපුකොටුව**